# ව්‍යවස්ථාව

## ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ

සංශෝධිත නාමය

**එක්සත් ජාතික පෙරමුණ**

# ප්‍රවේශය

සාමය, සහජීවනය, ආර්ථීක, සමාජික, නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය අගයන ශ්‍රී ලංකාවාසීහු තමන්ට,තම දරු මුණුපුරන්ට හා මතු පරපුරට නීතියේ රැකවරණය ද ආර්ථීක සමෘද්ධියද සෞභාග්‍යය ද මූලික මානව අයිතිවාසිකම් ද තහවුරු කරන ප්‍රජාතාන්ත්‍රික සමානාත්මතා සමාජයක සාමකාමීවද නිවහල්ව ද නිදහස්වද ජීවත්වීමට ඇති අයිතිය ආරක්ෂා කොට ගැනීමට වැඩි දියුණු කොට ගැනීමට ඇති අභිලාෂය තමන්ගේ පැවැත්මෙන් ද ඇප කැප වීමෙන්ද ක්‍රියාකාරකම් වලින්ද ප්‍රකාශ කර සිටින්නාහුය.

**'' එක්සත් ජාතික පෙරමුණ''** නැමති-

අපේ දේශපාලන පක්ෂය බිහිවූයේ නිදහසට සාධාරණත්වයට හා නීතියට තර්ජනයක් වූ ඒකාධිපති වූ ද අඥායක වූ ද පාලන ක්‍රමයක ස්වාභාවය හෙළිදරව් කොට ඊට එරෙහිව නැඟී සිටිමට ඇති අවශ්‍යතාවය හේතු කොට ගෙනය. එබැවින්, පාලන තන්ත්‍රයෙහිත් සමාජය පුරාමත් පැතිර පවතින ඒකාධිපති බලය සහමුලින්ම අතුගා දමා පූර්ණ නිදහස් නිවහල් රටක් බිහිකිරිමට අප පක්ෂය බැඳී සිටී.

ජාති, ජන්ම, කුල හා ආගම් ආදී කිසිදු භේදයකින් තොරව ලක්වාසීන් අතර සමානාත්මතාවය සුරැකීමට ඇප කැප වූ සකල විධ දේශප්‍රේමීන්ට අප පක්ෂයේ සිව් වාසල් දොරටු විවෘතය.

සමාජය වෛරයෙන් දවා පුරවැසියාගේ ප්‍රගතිය සංහිඳියාව හා සුහදතාව ප්‍රචණ්ඩාකාරි ලෙස සිඳ බිඳ ලූ අතීතය පිටු දැකිමට අප පක්ෂය කටයුතු කරනු ඇත. ආත්ම ලාභය පිණිස පටු පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ජාතිය, කුලය හා ආගම දඩම්මා කොට ගැනීමේ දේශපාලන සංස්කෘතිය එක්සත් ජාතික පෙරමුණ ඉඳුරා ප්‍රතික්ෂේප කරයි.

යුක්තිය, සාධාරණය හා නීතිය වෙනුවෙන් පෙනීසිටීම දඬුවම් ලැබිය හැකි වරදක්ම වූ භීෂන සමයක දිවි පරදුවට තබා කටයුතු කරද්දී ලද අමිහිරි අත්දැකීම් නිසාත්, අන්තවාදී බලවේගවල සැහැසිකම් නිසාත්, විධායක බලයේ අතුරු ඵලයක් වූ කැරලි කෝලාහල හා ඝාතන නිසාත්, යහ පාලනයට තිත තැබූ විකෘති දේශපාලන න්‍යාය පත්‍රය නිසාත් සිරගතවූ ලක්වාසීන් වහා නිදහස් කොට මිනිස්කම උතුරා යන නීතිය රජ වූ පූජනිය ජන සමාජය බිහි කිරීමට අප ඇප කැප වෙමු.

අපේ පක්ෂය ජනතාව විසින්ම ජනතාවගේ හද ගැස්ම අනුව ගොඩනගනු ලබන්නකි. ජනතාවගේ සිතුම් පැතුම් නිරන්තරයෙන් පිලිබිඹු වන අතර එය රට වැසියාගේ හෘද සාක්ෂියද වනු ඇත.

එබැවින් තමන්ගේ මාතෘ භූමිය වෙනුවෙන් මෙකී අභිමතාර්ථයන් සාක්ෂාත් කොට ගනු පිණිස අපේ අදහස්, අපේක්ෂා හා විශ්වාස කෙරේ පැහැදීමක් ඇති සියළුම ශ්‍රී ලංකික සහෝදර ජනතාවගෙන් අප උදක් ම ඉල්ලා සිටිනු ලබන්නේ අප පක්ෂය වටා රොද බැද එක් රොක් වන ලෙස ය.

# ව්‍යවස්ථාව

## මූලික ප්‍රතිපත්ති

(1) පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය ශ්‍රී ලංකාවේ නැවතත් පිහිටුවාලීමේ මූලික පරමාර්ථයෙන් අරඹනු ලබන '' එක්සත් ජාතික පෙරමුණ'' ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහ අරමුණු දිනා ගැනීම තහවුරු කිරීම හා රැක ගැනීම සඳහා කැපවුනු පක්ෂයයි.

(2) පුද්ගලවාදයට වඩා ප්‍රතිපත්තිය මුල්කොටගත් ''කවුරුද හරි නොව ''කුමක්ද හරි'' යන ආකල්පයෙහි පූර්ණ විශ්වාසයෙන් යුතුව කටයුතු කිරීම අප පක්ෂයේ ඒකායන පරමාර්ථයවේ.

(3) පක්ෂය මෙහෙය වීමේ දී පොදු බව රැකගෙන සැමට කන්දෙන පක්ෂ සාමාජිකත්වය ට මුල්තැන දෙන සඳ කල්හිම බහුතරයේ කැමැත්ත අනුව කටයුතු කරනු ඇත.

(4) අප පක්ෂය ජාති, ආගම්, කුල උස් පහත් සීමා බන්ධන වලින් නිදහස්ව ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ දැඩි විශ්වාසයක් සහිත සංවිධානයකි.

(5) ජාතික අවශ්‍යතායන් මත පදනම් වූ ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා අධ්‍යාපනික ප්‍රතිපත්ති සකස් විය යුත්තේ කාලීනව හා සමාජයේ පැවැත්මට සරිලන ආකාරයට බව තරයේ විශ්වාස කරන අප ඊට අනුකූල ප්‍රතිපත්ති ප්‍රකාශනයක් පාක්ෂිකයන්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත.

(6) ජන සමාජයට වැදගත් වන පොදු තීරණ ගැනීමේදී අප පක්ෂය ජනමතය විමසීම හා ඒ අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය සෑම පියවරක්ම ගැනීම සඳහා කැප වී සිටී.

(7) ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව තහවුරු වන අයුරින් විදේශ රටවල් සමඟ වඩා මිත්‍රත්වයකින් කටයුතු කල හැකි ඔවුනොවුන් අතර මිත්‍ර බන්ධනයට තුඩු දෙන විදේශ පිළිවෙතක් අනුව ක්‍රියා කිරීම හා ජාතියේ දේශයේ ගෞරවය ආරක්ෂා වන පරිදි වඩාත් ප්‍රායෝගික පිළිවෙතක් අනුගමනය කිරීම.

(8) පළමු පක්ෂ ව්‍යවස්ථාව 2011-06-15 දින සහ 2013-03-16 දින කරන ලද සංශෝධන ඇතුලත්ව නැවත මුද්‍රණය කරන ලද වත්මනෙහි බලපැවැත්වෙන ව්‍යවස්ථාව වේ.

**01. පරමාර්ථය:**

1.1 සියළුම මැතිවරණ ඡන්ද විමසුම් වලදී බලයට පත්වීමේ අරමුණ පෙරදැරි කරගෙන, දේශපාලන පක්ෂයක්, පර්ලිමේන්තුව තුල සහ රටේ සංවිධානය කර පවත්වාගෙන යෑම.

1.2 පක්ෂයේ සම්මේලනය විසින් අනුමත කරන ලද මූල ධර්ම සහ පක්ෂයේ මැතිවරණ ප්‍රකාශනයේ අඩංගු ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙල හැකිතාක් දුරට ක්‍රියාත්මක කිරීම.

1.3 ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුලින් ජනතාවගේ දේශපාලන සමාජ හා ආර්ථික විමුක්තිය ප්‍රජාතාන්ත්‍රික පදනමක් මත උන්නතියට පත් කිරීම සහ සර්ව ජන ඡන්දයත්, ජනතාවගේ මූලික අයිතිවාසිකම් පිළිගැනීමත්, සියළු දෙනාටම සමාන අයිතිවාසිකම් සහ එය අභිවර්ධනය කිරීමත් අපේක්ෂා කෙරේ.

1.4 පොදු ජනතාවට බලපාන්නාවූ වැදගත් ජාතික ප්‍රශ්න වලදී ජනතාව වෙනුවෙන් පෙනී සිටීම.

## 02. සාමාජිකත්වය:

දෙයාකාරය - 1. පුද්ගල සාමාජිකත්වය

2. සංවිධාන සාමාජිකත්වය

### 2.1 සුදුසුකම්:

2.1.1 පුද්ගල සාමාජිකත්වය:

අ) වයස අවුරුදු 16 කට නොඅඩු ඕනෑම කෙනෙකුට පක්ෂයේ සාමාජිකත්වය විවෘතව පවතී.

ආ) වෙනත් දේශපාලන පක්ෂයකට බැඳී සිටින සාමාජිකයෙකුට එක්සත් ජාතික පෙරමුණෙහි සාමාජිකත්වය ලබා ගත නොහැක.

2.1.2 සංවිධාන සාමාජිකත්වය: (අනුබද්ධ සංවිධාන)

අ) කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිර්දේශය මත පිළිගන්නා ලද්දා වූ වෘත්තීය සමිති.

ආ) කෘතයාධිකාරී මණ්ඩලයේ නිර්දේශය සහ අනුමැතිය මත පක්ෂයේ ප්‍රතිපත්ති සහ පරමාර්ථ වලට අනුකූල ජාතික විධායක සභාව විසින් පිළිගන්නා ලද්දා වූ වෘත්තීය සංවිධාන සහ ශිෂ්‍ය සංවිධාන.

ඇ) ඉහත (අ) සහ (ආ) හී සඳහන් සංගමයක සාමාජික සංඛ්‍යාව යටත් පිරිසෙයින් විසි පහක් (25) විය යුතුය.

### 2.2 සාමාජිකත්වය ලබා ගන්නා පිළිවෙල:

2.2.1 වසරේ ඕනෑම දිනයක පක්ෂයේ සාමාජිකත්වය ලැබිය හැකිය. එහෙත් වාර්ෂික සාමාජිකත්වය දෙසැම්බර් මස 31 වන දායින් අවසන්වේ.

2.2.2 සාමාජිකත්වය අපේක්ෂාකරණ අයෙකු විසින් නියමිත ආකෘතිපත්‍රය පුරවා එම වර්ෂයේ සාමාජික මුදල හා සාමාජික පතට නියමිත ගාස්තුවත් සමග තම ප්‍රදේශයේ ශාඛා සංවිධානයට හෝ පක්ෂ මූලස්ථානයට ඉදිරිපත් කළ යුතුය.

2.2.3 ඕනෑම සාමාජිකත්ව අපේක්ෂකයකුට තම ඉල්ලුම් පත්‍රය පිළිබඳව අභියාචනා පක්ෂ නායකයා වෙත ඉදිරිපත් කිරීමට අවසර තිබේ.

2.2.4 පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකයන් සඳහා පක්ෂයේ නායකතුමාගේ නිර්දේශය මත වසර 06 කට වලංගු පරිදි_විශේෂ සාමාජිකත්වයක් ලබාගත හැකිය.

2.2.5 සංවිධාන සාමාජිකත්ව ලබා ගැනීම සඳහා එකී සංවිධානය විසින් ඊට නියමිත ආකෘති පත්‍රය පුරවා පක්ෂයේ මහ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

2.2.6 පක්ෂය සංවර්ධනය කිරිම සහ ව්‍යාප්ත කිරීමට අවැසි ප්‍රතිපාදනයන් ලබාදෙන්නන් සඳහා යාවජීව සාමාජිකත්වය පක්ෂ නායකතුමාගේ නිර්දේශය සහ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතියෙන් පිරිනැමිය හැක. ඒ සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නියම කරන්නාවූ අවම යාවජීව සාමාජික මුදලට වඩා වැඩි ප්‍රතිපාදනයන් ලබා දිය යුතුය.

ඉහත 2.2.1, 2.2.4 සඳහන් සාමාජික මුදල් කිසිවටෙකත් ආපසු නොගෙවන අතර ඒ සඳහා එම තැනැත්තාට මුදල ආපසු ඉල්ලීමක්ද කල නොහැක.

## 2.3 සාමාජික ගාස්තු:

2.3.1 පක්ෂ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නියම කරන්නා වූ වාර්ෂික සාමාජික මුදලක් ගෙවීමට බැඳී සිටී.

2.3.2 වසර 06 කට වලංගු පරිදි විශේෂ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නියම කරන්නා වූ සාමාජික මුදලක් ගෙවීමට බැඳී සිටී.

2.3.3 සියළුම කෘත්‍යාධිකාරී මණ්ඩල සභිකයන් විසින් වර්ෂයකට අතිරේක වශයෙන් කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නියම කරන්නා වූ මුදලක් ගෙවිය යුතුය.

2.3.4 සියළුම ජාතික විධායක සභිකයන් විසින් වර්ෂයකට අතිරේක වශයෙන් ජාතික විධායක සභාව විසින් නියම කරන්නා වූ මුදලක් ගෙවිය යුතුය.

2.3.5 පක්ෂයේ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රීවරු, පළාත් පාලන මන්ත්‍රීවරු කෘත්‍යාධිකාරී මණ්ඩලය නිර්දේශ කරනු ලබන අනුග්‍රාහක සාමාජික මුදලක් වාර්ෂිකව ගෙවිය යුතුය.

## 2.4 සාමාජිකත්වය අළුත් කිරීම:

සාමාජිකත්වය අඛණ්ඩව පවත්වාගෙන යාමට සාමාජිකත්වය අවසන් වන වසරේ දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර සාමාජික මුදල් ගෙවා, සාමාජිකත්වය අළුත් කළ යුතුය.

## 2.5 සාමාජිකයින් සතු වගකීම් සහ අයිතිවාසිකම්:

2.5.1 සෑම සාමාජිකයෙකුම පක්ෂයේ ප්‍රතිපත්ති හා තීරණ ආරක්ෂා කිරීමටත් පක්ෂයේ පරමාර්ථ හා අරමුණු මුදුන්පත් කර තැනීමට ක්‍රියා කිරීමටත් හා පක්ෂය ජනතාව අතර ජනප්‍රිය කරවීමටත් බැඳී සිටියි.

2.5.2 සියළුම සාමාජිකත්වය පක්ෂයේ ප්‍රතිපත්ති, නීති, රීති, විනය හා චර්යා ධර්ම පද්ධතිය පිළිපැදීමට බැඳී සිටින අතර විනයානුකූල වීම ප්‍රමුඛතම අවශ්‍යතාවයයි.

2.5.3 පක්ෂයේ ව්‍යවස්ථාව සහ ස්ථාවර නියෝගවලට අනුකූලවීම උල්ලංඝනය කළ නොහැකි සමාජික වගකීමකි.

2.5.4 පක්ෂයේ ව්‍යවස්ථාව සහ ස්ථාවර නියෝගවලට අනුකූලව සෑම විටම ක්‍රියා කළ යුතුය.

2.5.4 පක්ෂය විසින් නාම යෝජනා කරන ලද අපේක්ෂකයන්ට හැකි සියලු සහයෝගය දීමටත් ඒ අපේක්ෂකයන් හට විරුද්ධව ඉදිරිපත් වන වෙනත් තැනැත්තන්ට කිසිදු සහයෝගයක් නොදීමටත් හා පක්ෂයෙන් අපේක්ෂකයෙකු ඉදිරිපත් නොකරණ අවස්ථාවල පිළිපැදිය යුතු ආකාරය කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සාමාජිකත්වය දැනුවත් කරනු ලබන අතර, එය පිළිගෙන ක්‍රියා කිරීම පක්ෂ සාමාජිකයාගේ පූර්ණ වගකීම වේ.

2.5.5 ඉහත සඳහන් ප්‍රතිඥා සමඟ ගැටෙන-ගැටීමට ඉඩ ඇති කිසිදු දේශපාලන හෝ වෙනත් ක්‍රියාකාරකමකට සම්බන්ධ නොවීම සහ පක්ෂය අපකීර්තියට පත් නොකිරීම හා එසේ වන පරිදි ක්‍රියා නොකිරීම.

2.5.6 ලියාපදිංචි කළ ශාඛා සංවිධාන උසුලන තත්වයන් සහ අයිතීන් වෙනත් සංවිධාන සාමාජිකයන්ටද නොවෙනස්ව භුක්තිවිදිය හැකි වන අතර එම සාමාජිකයන්ද ඉහත සඳහන් ප්‍රතිපත්ති පිළිගෙන ඒවාට අනුකූලව කටයුතු කළ යුතුය.

2.5.7 සංවිධාන සාමාජිකයන් ස්වකීය දේශපාලන රීති ක්‍රියාත්මක කිරීමට පෙර ඒවා කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

## 03. පක්ෂ සංවිධාන:

3.1 ශාඛා සංවිධානය

3.2 ඡන්ද බල ප්‍රදේශ සංවිධානය/ හෝ උප දිසාපති කොට්ඨාශ සංවිධානය

3.3 දිස්ත්‍රික් සංවිධානය

3.4 ජාතික විධායක සභාව

3.5 කෘත්‍යාධිකාරී මණ්ඩලය

3.6 විනය මණ්ඩලය

3.7 බුද්ධි මණ්ඩලය

3.8 පක්ෂ සම්මේලනය

3.9 එක්සත් ජාතික තරුණ පෙරමුණ

3.10 එක්සත් ජාතික කාන්තා පෙරමුණ

3.11 අනුබද්ධ සංවිධාන

3.12 විශේෂ මණ්ඩල

### 3.1 ශාඛා සංවිධානය:

3.1.1 අදාල ඡන්ද බලප්‍රදේශ සංවිධානය තුල පිහිටි එක් එක් ඡන්ද පොලකට හෝ ග්‍රාම සේවා නිලධාරි වසමකට යටත් පිරිසෙයින් එක් ශාඛා සංවිධානයක් බැගින් පිහිටවිය යුතුය.

3.1.2 අදාල ඡන්ද බල ප්‍රදේශ සංවිධාන තුල පිහිටි ග්‍රාම සේවා නිලධාරි වසම් අනුව ශාඛා සංවිධාන ගොඩනගන ආකාරය ඡන්ද බල ප්‍රදේශ සංවිධානය මගින් තීරණය කරනු ඇත.

3.1.3 ශාඛා සංවිධානයක් පිහිටුවීමේදී අවම වශයෙන් තිස් දෙනෙකුට (30) නොඅඩු පිරිසක් සිටිය යුතුය. පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අවසරය ඇති උසස් අධ්‍යාපන ආයතන හා වෙනත් ආයතන වලද, පක්ෂයේ ශාඛා සංවිධාන පිහිටුවිය හැකිය. එම විශේෂ සංවිධාන පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සංවිධාන වලට අනුබද්ධ විය යුතුයි.

3.1.4 ශාඛා සංවිධානකට පහත දැක්වෙන නිලධාරී මණ්ඩලය තෝරා පත්කර ගත යුතුය.

සභාපති
උප සභාපති
ලේකම්
උප ලේකම්
භාණ්ඩාගාරික
කාරක සභිකයින් දස දෙනෙක් (10)

අවශ්‍යතා අනුව අනුශාසකවරුද පත් කර ගත හැක.

3.1.5 කිසියම් ග්‍රාමසේවක කොට්ඨාශයක හෝ අනුබද්ධිත ග්‍රාමසේවක කොට්ඨාශවල පදිංචි පක්ෂයේ කාන්තා සාමාජිකයන් එකතු වී ශාඛා කාන්තා සංවිධානයක් පිහිටුවා ගත හැකිය. එවැනි සංවිධානයක සාමාජික සංඛ්‍යාව 15 ට නොඅඩු විය යුතුය.

3.1.6 ග්‍රාමසේවා කොට්ඨාශයක හෝ අනුබද්ධිත ග්‍රාමසේවක කොට්ඨාශවල පදිංචි වයස අවුරුදු 35 ට අඩු පක්ෂ සාමාජිකයන් එක්වී ශාඛා තරුණ සංවිධානයක් පිහිටුවා ගත හැකිය. එවැනි සංවිධානයක සාමාජික සංඛ්‍යාව 15 ට නොඅඩු විය යුතුය.

3.1.7 සියළුම ශාඛා සංවිධාන, තරුණ සංවිධාන හා කාන්තා සංවිධාන පක්ෂ මූලස්ථානයේ යථා පරිදි ලියා පදිංචි විය යුතුය.

## 3.2 ඡන්ද බල ප්‍රදේශ සංවිධානය / උප දිසාපති කොට්ඨාශ සංවිධානය:

3.2.1 එක් ඡන්ද ප්‍රදේශයකට හෝ උප දිසාපති කොට්ඨාශයකට එක් ඡන්ද ප්‍රදේශ සංවිධානයක් බැගින් පිහිටවනු ලැබිය යුතු අතර, එය යථා පරිදි පක්ෂ මූලස්ථානයේ ලියා පදිංචි කරනු ලැබිය යුතුය.

3.2.2 එක් ඡන්ද ප්‍රදේශයකට හෝ උප දිසාපති කොට්ඨාශයකට එක් සංවිධායකවරයකු බැගින් 3,2,7 වගන්තිය ප්‍රකාර පත් කළ යුතුය.

3.2.3 අදාල ඡන්ද බල ප්‍රදේශයේ උප දිසාපති කොට්ඨාශ සංවිධානය තුල ඇති ශාඛා සංවිධානවල සභාපතිවරු හා ලේකම්වරු නිල බලයෙන් ඡන්ද ප්‍රදේශ / උප දිසාපති කොට්ඨාශ සංවිධානයේ සාමාජිකයන් ලෙස පත්වේ. අදාළ ඡන්ද ප්‍රදේශ / උප දිසාපති කොට්ඨාශ තරුණ සංවිධානවල සහ කාන්තා සංවිධානවල සභාපතිවරු හා ලේකම්වරු නිල බලයෙන් ඡන්ද ප්‍රදේශ / උප දිසාපති කොට්ඨාශ සංවිධානයේ සාමාජිකයන් ලෙස පත්වේ.

3.2.4 අදාළ ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශයෙන් පක්ෂයට තේරීපත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් සහ පළාත් පාලන මන්ත්‍රීවරුන් නිල බලයෙන් එම ඡන්ද බල ප්‍රදේශ/උප දිසාපති කොට්ඨාශ සංවිධානයේ සාමාජිකයින් වනු ඇත.

3.2.5 පක්ෂ සම්මේලනයේදී පත්කරනු ලබන යම් නියෝජිතයකු අදාල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ නම් ඔහුද නිල බලයෙන් එම ඡන්ද බල ප්‍රදේශ සංවිධානයේ / උප දිසාපති කොට්ඨාශ සංවිධානයේ සාමාජිකයෙකු වේ. ඔහුට ඇතුල්විය හැක්කේ එක් ඡන්ද ප්‍රදේශයක / උප දිසාපති කොට්ඨාශයේ එක් සංවිධානයකට පමණි.

3.2.6 ඡන්ද ප්‍රදේශයේ/උප දිසාපති කොට්ඨාශ සංවිධානයේ ප්‍රථම රැස්වීම කැඳවීම පක්ෂයේ නායකයා හෝ බලය පවරන ලද නිලධාරියකු විසින් සිදුකරනු ඇත.

3.2.7 ඡන්ද ප්‍රදේශ/උප දිසාපති කොට්ඨාශ සංවිධායකවරු පත් කිරීම:

අ) එක් ඡන්ද ප්‍රදේශයක්/උප දිසාපති කොට්ඨාශයක් තුල පිහිටි ශාඛා සංවිධාන හා එම කොට්ඨාශ තුල පිහිටි තරුණ සංවිධාන සහ කාන්තා සංවිධානවල අදහස් විමසීමෙන් පසුව එම ඡන්ද ප්‍රදේශය / උප දිසාපති කොට්ඨාශය තුල සංවිධායකවරයා වශයෙන් පත් කරනු ලැබීමට සුදුසුයැයි අදහස් කරන සාමාජිකයන්ගේ නාම යෝජනා පක්ෂයේ මහ ලේකම් විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

ආ) කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නාම යෝජනා සලකා බලා ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ සංවිධානයේද අදහස් විමසීමෙන් පසු සුදුසු පුද්ගලයෙකු එම ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ සංවිධානයේ සංවිධායක වශයෙන් පක්ෂ නායකයාගේ අත්සනින් යුතුව පත් කල යුතුවේ. එසේ වුවද අවශ්‍යතාය මත ඡන්ද ප්‍රදේශ/උප දිසාපති කොට්ඨාශ සංවිධායකවරු පත් කිරීමේ පූර්ණ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතු වන්නේය.

3.2.8 ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ සංවිධානයේ නිලධාරී මණ්ඩලය :

ඇ) ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ සංවිධායක මෙම සංවිධානයේ සභාපති වශයෙන් නිල බලයෙන්ම පත්වන අතර , උප සභාපති වරු (05) පස් දෙනෙක්, ලේකම්, උප ලේකම්වරු පස් දෙනෙක් (05),භාණ්ඩාගාරික සහ කාරක සභිකයින් දහතර දෙනෙක් (14) ගෙන් යුක්තව, මෙහි නිලධාරී මණ්ඩලය සමන්විත වේ.

ආ) අදාළ ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ සංවිධානයේ පක්ෂයේ සාමාජිකයන් අතුරින් තේරී පත්වී සිටින, පළාත් සභා මන්ත්‍රීවරු, පළාත් පාලන ආයතනවල සභාපතිවරු සහ නගරාධිපතිවරුන් නිල බලයෙන් මෙම සංවිධානයේ උප සභාපතිවරුන් වේ.

ඇ) මෙහි නිලධාරී මණ්ඩලය ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලයද වන්නේය.

3.2.9 ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ සංවිධානයේ බලතල හා වගකීම්.

අ) මෙම සංවිධානය ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ තුල, පක්ෂය වෙනුවෙන් සියළු කටයුතු ඉටුකළ යුතුය.

ආ) එකී සංවිධානයේ යෝජනා සම්මුතියකින් පසුව පක්ෂයේ කාර්යන් සඳහා මුදල් එකතු කිරීමට ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ සංවිධානයට බලය තිබේ. එම යෝජනා ක්‍රියාත්මක කිරීමට පෙර, පක්ෂයේ මුදල් කාරක සභාවේ අනුමැතියි ලබා ගත යුතුය.

ඇ) කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන බැංකු ගිණුම් පවත්වාගෙන යාමට මෙම සංවිධනයට බලය තිබෙන අතර, සංවිධානයේ අයවැය වාර්ෂිකව සභා සම්මත කොට, එම වාර්ථාවේ පිටපත් පක්ෂ මූලස්ථානයට හෝ දිස්ත්‍රික් සංවිධානයට ඉදිරිපත් කළ යුතුය.

ඈ) මෙම සංවිධානය යටත් පිරිසෙයින් තෙමසකට වරක් හෝ රැස්විය යුතුයි.

ඉ) සාමාජික යුතුකම් පැහැර හරින හෝ පක්ෂ විරෝධීව ක්‍රියාකරන සාමාජිකයින් පිළිබඳව ලැබෙන පැමිණිලි මෙම සංවිධානයේ ක්‍රියාකාරී මණ්ඩලය විසින් සොයා බලා, එවැනි සිද්ධීන් සම්බන්ධව විනයානුකූල පියවරක් ගැනීමට අවශ්‍ය නම් ඒ සම්බන්ධව වාර්තාවක් අප්‍රමාදව පක්ෂයේ මහ ලේකම්වරයා වෙත එවිය යුතුය.

ඊ) එවැනි විරෝධතා සඳහා පැමිණිලි ලිපි අදාල සංවිධානයේ සභාපති හා ලේකම් යන දෙපලගේ අනුමැතිය මත ඉදිරිපත් කළ යුතුය.

## 3.3 දිස්ත්‍රික් සංවිධානය:

3.3.1 එක් එක් මැතිවරණ දිස්ත්‍රික්කයන් තුල දිස්ත්‍රික් සංවිධානය බැගින් පිහිටවිය යුතු අතර, එම සංවිධාන යථා පරිදි පක්ෂ මූලස්ථානයේ ලියාපදිංචි කරනු ලැබිය යුතුය.

3.3.2 දිස්ත්‍රික් සංවිධාන විසින්, ඒ මැතිවරණ දිස්ත්‍රික්කයේ කටයුතු පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ඇතිව ඉටුකල යුතුව තිබේ.

3.3.3 අදාළ මැතිවරණ දිස්ත්‍රික්කය තුල ඇති ඡන්ද බල ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ සංවිධානවල සභාපතිවරු සහ ලේකම්වරු නිල බලයෙන් සංවිධානයේ සාමාජිකයන් ලෙස පත්වේ.

3.3.4 අදාළ මැතිවරණ දිස්ත්‍රික් තරුණ සංවිධානයේ සහ දිස්ත්‍රික් කාන්තා සංවිධානයේ සභාපතිවරු හා ලේකම්වරු නිල බලයෙන් දිස්ත්‍රික් සංවිධාන සාමාජිකයන් ලෙස පත්වේ.

3.3.5 මැතිවරණ දිස්ත්‍රික්කයන් තුල ඇති අනුබද්ධ සංවිධාන වල සභාපතිවරු හා ලේකම්වරු නිල බලයෙන් දිස්ත්‍රික් සංවිධානයේ සාමාජිකයන් ලෙස පතිවේ.

3.3.6 උක්ත මැතිවරණ දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරීපත්වූ සියළුම මන්ත්‍රීවරු පළාත් සභා මන්ත්‍රීවරු සහ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන් නිල බලයෙන් දිස්ත්‍රික් සංවිධානයේ සාමාජිකයන් ලෙස පත්වේ.

3.3.7 දිස්ත්‍රික් සංවිධානයේ යුතුකම් හා වගකීම් :

අ) අදාළ මැතිවරණ දිස්ත්‍රික්කය තුළ පක්ෂයේ සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ආ) එම දිස්ත්‍රික්කය තුල ජනතාවගේ සුභ සිද්ධිය සඳහා වන සියළුම සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ඇ) ජාතික විධායක සභාව විසින් හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පවරණ ලද අනෙකුත් කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීම.

ඈ) අදාළ මැතිවරණ දිස්ත්‍රික්කයේ සියලු ඡන්ද කොට්ඨාශ වල ප්‍රධාන සංවිධායක වරුන්ගෙන් සමන්විත ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීම.

ඉ) මැතිවරණ දිස්ත්‍රික්කයේ සියළුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලය නියම කරන ආකාරයට නිලධාරී මණ්ඩලයක් පත් කළ යුතුව ඇත.

ඊ) දිස්ත්‍රික් සංවිධාන අවම වශයෙන් මාස 03 වතාවක් හෝ රැස්විය යුතුය. දිස්ත්‍රික් සංවිධානයේ වාර්ෂික සමුළුවේ මුලසුන නායකතුමා විසින් හෝ ඔහු නොමැති විටෙක පක්ෂයේ සභාපති විසින් හෝ පක්ෂයේ මහ ලේකම් වරයා විසින් හෝ ඔවුන් තිදෙනාම නොමැති විටෙක සමුළුවේ යෝජනා ස්ථිරත්වයෙන් මුලසුන සඳහා අයෙකු පත් කර ගැනීමට හැකිය.

## 3.4 ජාතික විධායක සභාව:

3.4.1 පක්ෂයේ ජාතික විධායක සභාව පහත සඳහන් පරිදි විය යුතුය.

අ) පක්ෂයේ නිලධාරී මණ්ඩලය සහ කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයින්

ආ) පක්ෂයේ පාර්ලිමේන්තු මණ්ත්‍රීවරුන්

ඇ) පක්ෂයේ පළාත් සභා මණ්ත්‍රීවරුන්

ඈ) ඡන්ද ප්‍රදේශ/ උප දිසාපති කොට්ඨාශ ප්‍රධාන සංවිධායකවරුන් සහ ලේකම්වරුන්

ඉ) පක්ෂයේ සාමාජිකයන් වන පළාත් පාලන ආයතනවල නියොජිතයන්

ඊ) එක්සත් ජාතික තරුණ පෙරමුණ නියෝජනය කරණ සාමාජිකයන් අතුරෙන් පහලොස්දෙනෙක් (15)

උ) එක්සත් ජාතික කාන්තා පෙරමුණ නියෝජනය කරන සාමාජිකයන් අතුරෙන් පහලොස් දෙනෙකු (15)

ඌ) එක්සත් ජාතික පෙරමුණට අනුබද්ධ වෘත්තීය සමිතිවල සාමාජිකයන්ගේ අනුපාතය අනුව නියම කරනු ලබන නියෝජිත සංඛ්‍යාවක්

එ) එක්සත් ජාතික පෙරමුණට අනුබද්ධ වෘත්තිකයන්ගේ සමිතිවල සාමාජිකයන්ගේ අනුපාතය අනුව නියම කරනු ලබන නියෝජිතයන් සංඛයාවක්

ඒ) පක්‍ෂ සම්මේලනයේදී තෝරා පත් කර ගනු ලබන තිස්පස් දෙනෙකුගෙන්ද (35) මෙම ජාතික විධායක සභාව ස්ථාපිත විය යුතුය.

ඔ) භෞමික වශයෙන් හෝ ආගමික වශයෙන් හෝ ජාතීන් වශයෙන් හෝ වෘත්තීය වශයෙන් හෝ වෙනත් වර්ගයකට අයත් වන්නා වූ ජන සමූහයක් ජාතික විධායක සභාවේ නියෝජනය නොවන බවට කෘත්‍යාධිකාරී මණ්ඩලය අදහස් කරන්නේ නම් කෘතයාධිකාරී මණ්ඩලය විසින් එම ජන සමූහය නියෝජනය වන ලෙසද පුද්ගලයින් පක්‍ෂයේ විධායක සභාවේ සාමාජිකයන් ලෙස පත් කළ යුතුය. එලෙස පත් කළ හැකි සාමාජිකයින් ගනන පහලොස් දෙනෙකුට (15) නොවැඩි වේ.

ඕ) පක්‍ෂ සම්මේලනයට සහභාගී වීම පිණිස නියෝජිතයින් වශයෙන් පත් කරනු ලැබූ සාමාජිකත්වයට පමණක් ජාතික විධායක සභාවේ අසුනක් සඳහා නාම යෝජනා කරනු ලැබීමට හිමිකම තිබේ.

ක) නාම යෝජනාව පක්‍ෂයේ සාමාජිකයන් දෙදෙනෙකු විසින් යෝජනා ස්ථිර කොට අපේක්‍ෂකයාගේ කැමැත්තද සහිතව පක්‍ෂයේ මහ ලේකම් වරයාට යොමු කළ යුතුය.

ග) කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් යෝජනා කරනු ලැබුවා වූ වාර්ෂික මහා සම්මේලනයේදී තෝරා පත්කර ගන්නා පක්‍ෂයේ නිලධාරීන්ගේ නාම යෝජනා ස්ථිර කර වාර්ෂික මහා සම්මේලනයවයට ඉදිරිපත් කළ යුතුය. ජාතික විධායක කමිටුවේ නාම යෝජනා සම්බන්ධ තීරණ ගැනීම කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුය.

## 3.4.2 ජාතික විධායක සභාවේ බලතල හා වගකීම්:

අ) පොදුවේ පක්‍ෂය පිළිබදව මෙන්ම පක්‍ෂ ව්‍යවස්ථාවේ කවර අංගයක් පිළිබදව වුවද මෙම සභාව විසින් දෙනු ලබන තීරණය අවසන් තීරණය වේ.

ආ) එක් එක් පාර්ලිමේන්තු සැසි වාරය ආරම්භ කිරීමේදී හෝ පක්‍ෂයට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වීමට අවශ්‍ය වූ විටකදී විධායක සභාව හෝ පාර්ලිමේන්තු කණ්ඩායම අපේක්‍ෂා කරන වෙනත් යම් අවස්ථාවකදී පාර්ලිමේන්තු කණ්ඩායම සමග සාකච්ඡා පැවැත්වීම.

ඇ) පක්‍ෂයේ ව්‍යවස්ථාවට සහ ස්ථාවර නියෝග වලට සියළු නිලයන් හා සාමාජිකත්වය අනුකූල වන බවට වග බලා ගැනීම.

ඈ) පක්‍ෂ සම්මේලනය කැඳවීම අවශ්‍ය වන විටක සම්මේලනයේ විශේෂ රැස්වීම් වාර කැඳවීම, සහ විධායක සභික ධූරය දරු වර්ෂය තුල පක්‍ෂයේ කටයුතු පිළිබදව වාර්ථාවක් පිළියෙල කොට ඉදිරිපත් කිරීම.

ඉ) ව්‍යවස්ථාවට, ස්ථාවර නියෝග වලට, රීති වලට විනය පද්ධතියට හෝ චර්යා ධර්ම පද්ධතියට යම් සංශෝධනයක් යෝජනා කිරීම සහ අළුත් රීති සකස් කොට ඒවා වාර්ෂික සම්මේලනය වෙත හෝ විශේෂ පක්‍ෂ සම්මේලනය වෙත ඉදිරිපත් කිරීම සහ දේශපාලන තත්වයට අනුකූලව අවශ්‍ය විය හැකි පක්‍ෂයේ අභියාචන වලට බලපාන සියලු යෝජනා සහ අදහස් ඉදිරිපත් කිරීම.

ඊ) මෙම ව්‍යවස්ථාවෙහි 2.1.1 සහ 2.1.2 වගන්තිවල ඇතුලත් පක්‍ෂ සාමාජිකයෙකු හෝ සංවිධානයක් පක්‍ෂයේ ව්‍යවස්ථාව හෝ ප්‍රතිපත්ති උල්ලංඝනය කළ විට හෝ පක්‍ෂ විනය කඩ කල විට හෝ පක්‍ෂයට අහිතකර අන්දමට ක්‍රියා කල විට හෝ ඒ පිළිබදව නිර්දේශයන් සහිතවූ වාර්ථාවක් මෙම ව්‍යවස්ථාවේ සඳහන් කිසියම් සංවිධානයක් විසින් පක්‍ෂ නායකතුමා වෙත දැන්වීමෙන් පසු හෝ වෙනයම් ආකාරයකින් පක්‍ෂ නායකතුමාට ඒත්තු ගිය විට මහ ලේකම් වරයා මගින්

පරීක්ෂණ නිළධාරියකු හෝ පරීක්ෂණ මණ්ඩලයක් මගින් මූලික පරීක්ෂණයක් පවත්වා බැලූ බැල්මට කරන ලද වරදක් ඇත්නම් අදාල සාමාජිකයාට හෝ සංවිධානයට එරෙහිව චෝදනා පත්‍රයක් සකසා නිදහසට කරනු විමසිය යුතුය. ඉදිරිපත් කරන නිදහසට කරනු ප්‍රමාණවත් නොවේනම් විධිමත් විනය පරීක්ෂණයක් සඳහා විනය මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. මහ ලේකම්වරයා මගින් අදාළ පක්ෂ සාමාජිකයෙකු හෝ සංවිධානය වෙත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර එම චෝදනා සම්බන්ධයෙන් චූදිතයාට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දිය යුතුය. ඉන් පසු ඒ පිළිබඳව වාර්තාවක් සමඟ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා විනය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. විනය මණ්ඩලය විසින් අදාළ විනය කඩකිරීම පිළිබඳව පරීක්ෂණය පවත්වා තම තීරණය කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර, ඒ වාර්තාව පක්ෂයේ මහ ලේකම්වරයා ජාතික විධායක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව උක්ත වාර්තාව සලකා බලා අදාළ සාමාජිකයා පක්ෂයෙන් නෙරපීම, සංවිධානයක් නම් එම සංවිධානය විසුරුවා හැරීම ඇතුළු වෙනයම් විනයානුකූල පියවරයන් ගැනීමට ජාතික විධායක සභාවට බලය ඇත. ජාතික විධායක සභාවේ තීරණයකින් සෑහීමකට පත් නොවන්නේ නම් පක්ෂයේ මහා සම්මේලනය වෙත අභියාචනය කිරීමේ අයිතිය එම චූදිත සාමාජිකයා හෝ සංවිධානයට තිබේ.

උ) සියලු මැතිවරණ සහ අනෙකුත් ඡන්ද විමසීම් සඳහා වියදම් කිරීමට මැතිවරණ අරමුදලක් ගොඩනගා පවත්වාගෙන යෑම.

ඌ) සාමාජික සාමාජිකාවන්, ශාඛා සංවිධාන හා අනෙකුත් සංවිධාන අතර උද්ගත වන ආරවුල් ජාතික විධායක සභාව මැදිහත්ව විනිශ්චය කළ යුතු අතර, විධායක සභාවේ තීන්දුව පිළිගැනීමට අදාළ සංවිධාන හා සාමාජිකත්වය බැඳී සිටී.

එ) පක්ෂයේ යහපත නංවාලීම අරභයා වූ යම් යම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මණ්ඩලයක් හෝ මණ්ඩල ජාතික විධායක සභාව විසින් ඇති කරනු ලැබිය හැකි අතර එකී මණ්ඩලයන් හෝ මණ්ඩල සඳහා සාමාන්‍ය හෝ විශේෂ විධාන නිකුත් කිරීමේ බලය ජාතික විධායක සභාව සතුය.

ඒ) ඡන්ද විමසීමක දී සංවිධාන කටයුතු වෙනුවෙන් වූ සෑම ආධාරයක්ම පක්ෂයේ අපේක්ෂකයාට හෝ අපේක්ෂකයින්ට, දීමට අනුකාරක සභාවක් ජාතික විධායක සභාව විසින් පත් කරනු ලැබිය යුතුය.

ඔ) එබඳු ඡන්ද විමසීමක දී පක්ෂයෙන් අපේක්ෂකයකු හෝ අපේක්ෂකයින් ඉදිරිපත් නොකිරීමට ජාතික විධායක සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. එවැනි අවස්ථාවක දී ශාඛා සංවිධාන, ඡන්ද කොට්ඨාශ සංවිධාන සහ දිස්ත්‍රික් සංවිධාන විසින් ඒ තීරණය පිළිගෙන අපේක්ෂකයකු හෝ අපේක්ෂකයන් ඉදිරිපත් කිරීම නොකළ යුතුය.

ඕ) ජාතික විධායක සභාව විසින් විගණන නිලධාරි වරයෙකු පත් කරනු ලැබේ.

ක) ජාතික විධායක සභාව විසින් නිශ්චය කරනු ලබන ස්වකීය බලතල කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත පැවරිය හැක.

ග) ජාතික විධායක සභාව අවම වශයෙන් මාස 06 කට වරක් රැස්විය යුතු අතර අවශ්‍ය වන ඕනෑම විටකදී පක්ෂ නායකතුමාට හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලයට ජාතික විධායක සභාව කැඳවීම් කල හැක.

### 3.5 කෘත්‍යාධිකාරී මණ්ඩලය:

3.5.1 කෘත්‍යාධිකාරී මණ්ඩලය පහත සදහන් පරිදි විය යුතුය.

අ) පක්ෂයේ මහා සම්මේලනය විසින් තෝරා පත් කර ගන්නා ලද පක්ෂයේ නිලධාරින් පහත දැක්වේ. එනම්

| | |
|---|---|
| පක්ෂ නායක තුමා | 01 |
| සභාපති තුමා | 01 |
| උප සභාපති තුමා | 05 |
| උප ලේකම් තුමා | 05 |

ආ) පක්ෂ නායකතුමන් විසින් තෝරා පත් කර ගන්නා ලද පක්ෂයේ නිලධාරින් පහත දැක්වේ. එනම්

| | |
|---|---|
| මහ ලේකම් තුමා | 01 |
| පරිපාලන ලේකම් තුමා | 01 |
| භාණ්ඩාගාරික තුමා | 01 |

ඇ) පක්ෂයට ඇතුලත් සියළු සංවිධාන නියෝජනය වන පරිදි ජාතික විධායක සභාව විසින් පත් කරනු ලබන 30 දෙනෙකුට නොවැඩි නියෝජිත පිරිසක් අනුමත ජන්ද ක්‍රමයකින් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයින් ලෙස තෝරා පත් කරගත හැක.

ඈ) ඊට අමතරව විශේෂිත දක්ෂතා සහිත පක්ෂ සාමාජිකයින් (06) හය දෙනෙක් පක්ෂ නායකයා විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයින් ලෙස තෝරා පත් කරගත යුතුය.

ඉ) කෘත්‍යාධිකාරී මණ්ඩලය සඳහා වූ නාම යෝජනා ඒ සමස්ථ දිස්ත්‍රික් සංවිධාන, ජන්ද බල ප්‍රදේශ/උප දිසාපති කොට්ඨාශ සංවිධාන වලද අදහස් විමසා පක්ෂයේ මහ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වන අතර අනුබද්ධ සංවිධානයක් සඳහා වූ නාම යෝජනා එම සංවිධානයේ ලේකම්වරයා විසින් සංවිධානයේ අදහස් විමසා පක්ෂයේ මහ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

ඊ) ඒ ඒ දිස්ත්‍රික්ක හා අනුබද්ධ සංවිධාන සඳහා වෙන් කරනු ලබන නියෝජිත සංඛ්‍යාව කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නියම කරනු ඇත.

### 3.5.2 කෘත්‍යාධිකාරී මණ්ඩලය සතු බලතල සහ කාර්යය:

අ) පක්ෂයේ ක්‍රියාකාරී සභාව වන්නේය.

ආ) මෙම ව්‍යවස්ථාවෙහි 2.1.1 සහ 2.1.2 වගන්තිවල ඇතුලත් පුද්ගල සාමාජික සහ කවරම සංවිධානයක හෝ සමාජිකයෙකු ගේ හෝ නිලධාරියෙකුගේ හෝ නියෝජිතයෙකුගේ හෝ ජන්ද බල ප්‍රදේශ, උප දිසාපති කොට්ඨාශ සංවිධායක වරයෙකුගේ හෝ පක්ෂ සාමාජිකයෙකුගේ ක්‍රියා කලාපය පක්ෂයේ ව්‍යවස්ථාවට ප්‍රතිපත්ති වලට , නීතිරීති වලට, වැඩ පිළිවෙලට හා ගන්නා ලද තීන්දු තීරණ වලට පටහැනි යැයි ද, නැතහොත් පක්ෂයට හානිකර යැයි ද කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඒත්තු ගියහොත් එම සංවිධානයේ හෝ සාමාජිකයාගේ හෝ නියෝජිතයාගේ හෝ නිලධාරියාගේ පක්ෂ සාමාජිකත්වය සහ නිලයක් ඇත්නම් නිලයද අත්හිටුවා ඒ පිළිබඳව විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගැනිම සඳහා විනය මණ්ඩලය වෙත යොමු කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය තිබේ.

ඇ) කෘත්‍යාධිකාරී මණ්ඩලයේ විශේෂ රැස්වීම් කැඳවීමට පක්ෂ නායකතුමාට විශේෂ බලය හිමි වන අතර ඔහුගේ අනුමැතිය ඇතිව මහ ලේකම්වරයාට හෝ පක්ෂ සභාපති වරයාටද කැඳවීම් කළ හැක.

ඈ) විනය මණ්ඩල, නාම යෝජනා මණ්ඩලය ඇතුලු විවිධ මණ්ඩල හා විවිධ කමිටු පත් කිරිමට පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය තිබේ.

ඉ) සාමාජිකයෙකුගේ හෝ සංවිධානයක පක්ෂ ක්‍රියාකාරකම් තහනම් කරනු ලැබූ අවස්ථාවක පක්ෂයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වූ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුය.

ඊ) ජාතික විධායක සභාව විසින් පවරන ලද බලතල සහ කාර්‍යයන් ක්‍රියාත්මක කිරීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඇත.

උ) පක්ෂ සම්මේලනයේ න්‍යාය පත්‍රය පිළියෙල කිරීම, ව්‍යවස්ථාවේ අන්තර්ගත බලතල සහ විධිවිධානයක් ක්‍රියාත්මක කිරිම.

ඌ) පක්ෂයේ උන්නතියට අදාල වන්නා වූ සාමාන්‍ය කටයුතු කිරීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුවේ.

ඒ ) අවශ්‍යයැයි හැඟෙන කුමන අවස්ථාවකදී වුවත් පක්ෂයේ විශේෂ සම්මේලනයක් කැඳවීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුවේ.

ඒ) කෘත්‍යාධිකාරී මණ්ඩලය සිය ක්‍රියාකාරකම් සම්බන්ධව තීරණයක් ගැනීමේදී විධායක කමිටුවේ වගකීමට බැඳී සිටින අතර කෘත්‍යාධිකාරී මණ්ඩලය අවම වශයෙන් මාස 03 කට වරක් රැස්විය යුතුය.

ඔ) වාර්ෂික මහා සම්මේලනයේදී තෝරා පත්කර ගන්නා පක්ෂයේ නිලධාරීන්ගේ නාම යෝජනා සකස් කර ජාතික විධායක සභාවට ඉදිරිපත් කළ යුතුය. තම කමිටුවල හෝ ධූරවල පුරප්පාඩු පිරවීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතුවන අතර එසේ පත්කරන සාමාජිකයන් විසින් එම ධූරය දැරිය යුත්තේ ඊළඟ වාර්ෂික සම්මේලනය තෙක් පමණි.

### 3.6 විනය මණ්ඩලය:

පක්ෂයේ සියලු අංශ වල දැඩි විනයක් පවත්වා ගැනීමට කැපවී ක්‍රියාකිරීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ජාතික විධායක සභාවේ අනුමැතිය ඇතිව (වාර්ෂිකව) පස් දෙනෙකුගෙන් (05) සමන්විත විනය මණ්ඩලයක් පත් කළ යුතුය. මෙකී විනය මණ්ඩලයේ වගකීම් හා කාර්‍යය භාරය තීරණය කරනු ලබන්නේ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයයි.

### 3.7. බුද්ධි මණ්ඩලය:

සෑම දිස්ත්‍රික්කයකින්ම පත් කරනු ලබන එක් නියෝජිතයෙකු බැගින් ද විවිධ අංශයන් පිළිබඳ විශේෂ දැනුමක් ඇති පුද්ගලයින් ද ඇතුලත්වන සේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් බුද්ධි මණ්ඩලයක් පත් කළ යුතුය. මෙම බුද්ධි මණ්ඩලයේ කාර්‍යයන් කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර බුද්ධි මණ්ඩලය පත්කිරීමට ද අනුගමනය කළ යුත්තේද ඉහත විනය මණ්ඩලය පත් කිරීමට පාදක කරගත් ක්‍රියා පිළිවෙතයි.

### 3.8. පක්ෂ සම්මේලනය:

3.8.1. ජාතික විධායක සභාව විසින් විශේෂ යෝජනා සම්මුතියක් මගින් අන්‍යාකාරයකට තීරණය කරනු ලැබුව හොත් මිස, ප්‍රධාන සම්මේලනය සෑම වර්ෂයක් පසාම පවත්වනු ලැබේ. දෙසැම්බර් මාසයේ දී පමණ වාර්ෂික සම්මේලනය කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් කැඳවිය යුතුය. අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවකදී පක්ෂයේ නායක විසින් හෝ ඔහුගේ නිර්දේශය මත සභාපති විසින් හෝ මහ ලේකම් විසින් හෝ ජාතික විධායක සභාව විසින්

හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් හෝ නැතහොත් (200) දෙසියයක සමාජික පිරිසක් විසින් අත්සන් කරන ලද පක්ෂයේ නායක වරයා වෙත කරන ලද ඉල්ලීමක් මත,පක්ෂයේ විශේෂ සම්මේලනයේ රැස්වීම් වාරයක් කැඳවනු ලැබිය හැකිය.

3.8.2. විශේෂ රැස්වීම් වාරයක් පැවැත්වීමට නම් අවමයෙන් දින හතක් (07) කල්තබා දැන්වීම් යැවිය යුතු අතර, ඒ රැස්වීම් වාරය කැඳවන ලද්දේ කවර කරුණු ගැන සාකච්ඡා කිරීමටද යන්න දැන්වීම් පත්‍රයේ සඳහන් කළ යුතුය.

3.8.3. පක්ෂ සම්මේලනය, සංවිධානය කිරීමේදී හා මෙහෙයවීමේදී ව්‍යවස්ථාවට සහ ස්ථාවර නියෝග වලට යටත්ව එය සිදුකළ යුතුය.

3.8.4. පක්ෂයේ ව්‍යවස්ථාවද පක්ෂයේ සාමූහික වගකීම කෙරේ බලපාන පක්ෂ ක්‍රියාකාරකම්ද ස්ථාවර නියෝග හා රීති ද වෙනස් කිරීමෙන්, අවලංගු කිරීමෙන් හෝ එවාට ආදේශයන් කිරීමෙන් එවා සංශෝධනය කිරීමේ බලය පක්ෂ සම්මේලනය සතු වේ. කෙසේ වුවද පක්ෂයේ ව්‍යවස්ථාව සංශෝධනය කල හැක්කේ සම්මේලනයට පැමිණ සිටින පක්ෂ නියෝජිතයින්ගේ තුනෙන් දෙකක(2/3) ඡන්ද අනුමැතියකින් පමණි.

**3.8.5. පක්ෂ සම්මේලනයට සහභාගි වියහැකි නියෝජිතයෝ:**

පක්ෂ සම්මේලනය පහත දැක්වෙ සාමාජිකයන්ගේන් සමන්විත වේ.

අ) ලියාපංදිචි කළ එක් ඡන්ද බල ප්‍රදේශය/උප දිසාපති කොට්ඨාශ සංවිධායක බල ප්‍රදේශයක පිහටා ඇති පක්ෂ ශාඛා සංවිධාන, තරුණ සංවිධාන සහ කාන්තා සංවිධාන වලින් ඒ ඡන්ද ප්‍රදේශය /උප දිසාපති කොට්ඨාශය සමඟ සාකච්ඡා කිරීමෙන් පසු කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියෝජිතයින් සංඛ්‍යාවක් පක්ෂ සම්මේලනයට සහභාගි කර ගත හැක.

ආ) ශාඛා සංවිධාන, තරුණ සංවිධාන සහ කාන්තා සංවිධාන මඟින් පක්ෂ සම්මේලනයට සහභාගි වීමට පත්කරන නියෝජිතවරු ප්‍රධාන සංවිධානයේ හෝ තරුණ සංවිධාන යේ හෝ කාන්තා සංවිධානයේ හෝ අව්‍යාජ සාමාජිකයෙකු විය යුතුය.

ඇ) පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියෝජිතයින් සංඛ්‍යාවක් දිස්ත්‍රික් සංවිධානය මඟින් එවනු ලැබිය හැක.

ඈ) 2.1.2 වන වගන්තියේ ප්‍රකාර ඇති කරන ලද අනුබද්ධ සංවිධාන වලින් එක් අනුබද්ධ සංවිධානයකින් අනුපාතය අනුව කෘත්‍යාධිකාරී මණ්ඩලය නිගමනය කරනු ලබන එහි සාමාජිකත්වයේ නියෝජිත සංඛ්‍යාවක්.

ඉ) කෘත්‍යාධිකාරී මණ්ඩලය සහ ජාතික විධායක සභාවේ නිලධාරීන් සහ අනෙකුත් සාමාජිකයන්.

ඊ) පක්ෂයේ සාමාජිකයන් වන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ,පළාත් සභා මන්ත්‍රීවරුන්, පළාත් පාලන මන්ත්‍රීවරුන්

උ) එක් එක් ඡන්ද ප්‍රදේශ වල ශාඛා සංවිධානවල සභාපතිවරු හා ලේකම්වරු

ඌ) යම් තැනැත්තෙකු පක්ෂයේ සමාජිකයෙකු විමෙන් පසු, කවර අවස්ථාවක වුවද, පක්ෂයේ ආධාරය දෙන ලද ඡන්ද අපේක්ෂකයෙකුට විරුද්ධ ඡන්ද අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වී ඇත්නම් හෝ පක්ෂයේ ආධාරය දෙන ලද ඡන්ද අපේක්ෂකයාට ප්‍රති විරුද්ධ යම් ඡන්ද අපේක්ෂකයකුට සහයෝගය දී ඇත්නම් හෝ පාර්ලිමේන්තු හෝ පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයක යම් අසුනක් සඳහා වූ ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් පක්ෂයේ නාම යෝජනා කිරීමේ මණ්ඩලය විසින් ගනු ලැබූ යම් තීරණයකට පටහැනිව ක්‍රියා කර ඇත්නම්

හෝ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ හෝ ජාතික විධායක සභාවේ තහනම් කරනු ලැබූ හෝ සාමාජිකත්වයෙන් බැහැර කරනු ලැබ ඇත්නම් හෝ එවැනි තැනැත්තෙකු නියෝජිත වරයෙකු ලෙස පත් කරනු නොලැබේ.

එ ) මණ්ඩල හෝ සංවිධාන දෙකක නියෝජිතයෙකු වශයෙන් එකම තැනැත්තෙකු ක්‍රියා නොකළ යුතුය.

### 3.8.6. පක්ෂයේ නිලධාරීන් පත්කිරීම

වාර්ෂික මහා සම්මේලනයේදී කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සහ විධායක සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් පක්ෂයේ නිලධාරීන් වන පක්ෂ නායක වරයා, සභාපති වරයා, උප සභාපතිවරුන් 5 දෙනා සහ උප ලේකම් වරුන් 5 දෙනා සම්මුතියකින් හෝ පක්ෂ සම්මේලනයේ ක්‍රියා පටිපාටිය අනුව තෝරා පත්කර ගත යුතුය. එසේ නමුත් මහ ලේකම්වරයා, පරිපාලන ලේකම්වරයා සහ භාණ්ඩාගාරිකවරයා පමණක් පත්කිරීමේ සහ ඉවත්කිරීමේ පූර්ණ බලය පක්ෂ නායකතුමාගේ අභිමතය පරිදි සිදු වන්නේය.

### 3.8.7. පක්ෂ සම්මේලනයේ ක්‍රියා පටිපාටිය:

වාද, විවාද, යෝජනා, සංශෝධන වලින් ඡන්දය දිය යුතු ආකාරය සම්බන්ධයෙන් පක්ෂ සම්මේලනයේ දී අනුගමනය කළ යුතු පිළිවෙත හැකිතාක් දුරට පාර්ලිමේන්තුවේ අනුගමනය කෙරෙන ක්‍රියා පටිපාටිය විය යුතු අතර, එය පක්ෂයේ ව්‍යවස්ථාවට සහ ස්ථාවර නියෝග වලටද අනුකූල විය යුතුය.

### 3.9. එක්සත් ජාතික තරුණ පෙරමුණ:

3.9.1 ''එක්සත් ජාතික තරුණ පෙරමුණ'' ලියාපදිංචි කළ ශාඛා තරුණ සංවිධාන වලින් සමන්විත විය යුතුවේ.

3.9.2. එක් ඡන්ද කොට්ඨාශයක් තුල පිහිටුවා ඇති ශාඛා තරුණ සංවිධානවල සභාපතිවරු සහ ලේකම්වරු ඡන්ද බල ප්‍රදේශ තරුණ සංවිධානයේ සාමාජිකයෝ වෙති.

3.9.3 එක් එක් මැතිවරණ දිස්ත්‍රික්කයන් තුල ඡන්ද බල ප්‍රදේශ තරුණ සංවිධානවල සභාපතිවරු සහ ලේකම්වරු දිස්ත්‍රික් තරුණ සංවිධානයේ සාමාජිකයෝ වන්නාහ .

3.9.4. මෙම සංවිධානයට පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිර්දේශය මත විධායක සභාව විසින් සුදුසු ව්‍යවස්ථාවක් සකස්කොට අනුමත කළ යුතුයි.

### 3.10 එක්සත් ජාතික කාන්තා පෙරමුණ:

3.10.1 එක්සත් ජාතික කාන්තා පෙරමුණ, ලියාපදිංචි කරන ලද ශාඛා කාන්තා සංවිධාන වලින් සමන්විත විය යුතුය.

3.10.2 එක් ඡන්ද කොට්ඨාශයක් තුල පිහිටුවා ඇති ශාඛා කාන්තා සංවිධානවල සභාපතිවරු සහ ලේකම්වරු දිස්ත්‍රික් කාන්තා සංවිධානයේ සාමාජිකයෝය.

3.10.3 එක් එක් මැතිවරණ දිස්ත්‍රික්කයන් තුල ඡන්ද බල ප්‍රදේශ කාන්තා සංවිධානවල සභාපතිවරු සහ ලේකම්වරු දිස්ත්‍රික් කාන්තා සාමාජිකයෝ වෙති.

3.10.4 මෙම සංවිධානයට පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිර්දේශය මත විධායක සභාව විසින් සුදුසු ව්‍යවස්ථාවක් සකස්කොට අනුමත කළ යුතුයි.

## 3.11 අනුබද්ධ සංවිධාන:

3.11.1 එක්සත් ජාතික පෙරමුණ යටතේ විවිධ වෘත්තිකයින් නියෝජනය වන පරිදි එක් වෘත්තියකට එක් අනුබද්ධ සංවිධානයක් බැගින් අනුබද්ධ සංවිධාන පිහිටුවිය යුතුය.

3.11.2 එක්සත් ජාතික පෙරමුණ යටතේ වෘත්තිය සමිති එහි අනුබද්ධ සංවිධාන වශයෙන් පත් කළ හැක.

3.11.3 අනුබද්ධ සංවිධාන සඳහා සුදුසු ව්‍යවස්ථාවක් පක්ෂයේ ව්‍යවස්ථාවට පටහැනි නොවන පරිදි කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නිර්දේශ කළ යුතුව තිබේ.

## 3.12 විශේෂ මණ්ඩලය:

එක්සත් ජාතික පෙරමුණ තරුණ, කාන්තා සංවිධාන ඇතුළු සියළුම අනුබද්ධ සංවිධාන හා පක්ෂ අතර, සමීප සම්බන්ධතාව පවත්වා ගෙන යාම සඳහා විශේෂ මණ්ඩල පත් කිරීමට කෘත්‍යාධිකාරී මණ්ඩලයට බලය තිබේ. එම විශේෂ මණ්ඩලයන්හි වගකීම් හා කාර්යය භාරයන් කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කළ යුතුය.

## 04. ස්ථාවර නියෝග:

4.1 පක්ෂයේ ව්‍යවස්ථාවට යටත්ව පක්ෂයේ වැඩපිළිවෙලට අදාළ සියළු ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වන ස්ථාවර නියෝග පක්ෂ සම්මේලනයේදී යෝජනා සම්මතයන් මගින් සකසා ගත යුතුය.

4.2 පක්ෂ සම්මේලනයකදී බහුතර ඡන්දයෙන් සම්මත වන යෝජනා මගින් අළුත් ස්ථාවර නියෝග සෑදීම හෝ පවතින ස්ථාවර නියෝග සංශෝධනය කිරීම අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

## 05. න්‍යාය පත්‍රය:

5.1 වාර්ෂික පක්ෂ සම්මේලනයට ඉදිරිපත් කෙරෙන යෝජනා න්‍යාය පත්‍රයේ ඇතුලත් කිරීම සඳහා ඒ පිළිබඳ ලිඛිත දැන්වීම, සම්මේලන වාරය ආරම්භ කිරීමට යටත් පිරිසෙයින් මසකට කලින් පක්ෂයේ මහ ලේකම් වරයාට ලැබෙන සේ ප්‍රධාන කාර්යාලයට එවිය යුතුය. එකී යෝජනා අතුරින් න්‍යාය පත්‍රයට ඇතුලත් කළ යුත්තේ කවර යෝජනාදැයි තීරණය කිරීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලය සතු වන අතර, සම්මේලන වාරය ආරම්භ කිරීමට අඩු තරමින් දින දාහතරකටවත් (14) කලින් න්‍යාය පත්‍රය නිකුත් කරනු ලැබිය යුතුය.

5.2 යෝජනා සම්බන්ධයෙන් දෙකකට වැඩි නොවිය යුතු සංශෝධන (අනුෂංගික, සංශෝධන හැර) පිළිබඳව දැන්වීම්, සම්මේලන වාරය ආරම්භ කිරීමට දින දහයකට (10) නොඅඩු කාලයකට පෙර යැවිය යුතු අතර විශේෂ සම්මේලන වාරයක් සම්බන්ධයෙන් වන විට පැය විසිහතරකට කලින් දැනුම් දීම ප්‍රමාණවත් වේ.

5.3 ජාතික විධායක සභාවට සහ කෘත්‍යාධිකාරී මණ්ඩල සභික ධුර සඳහා නාම යෝජනා, සම්මේලන වාරය ආරම්භ කිරීමට මාසයකට පෙර මහ ලේකම් වරයා මගින් කෘත්‍යාධිකාරී මණ්ඩලය වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

5.4 න්‍යාය පත්‍රයේ අඩංගු යෝජනා වලින් උද්ගතවන කරුණු හැර වෙනත් කරුණු කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලැබ තිබුනහොත් විනා සම්මේලනය විසින් සැලකිල්ලට භාජනය නොකළ යුතුය. එසේ වුවත්, න්‍යාය පත්‍රයේ අඩංගු නොවන එහෙත් පක්ෂ සාමාජිකත්වයේ හෝ පක්ෂයේ උන්නතිය සඳහා අදාල වන්නා වූ නව යෝජනා සම්බන්ධයෙන් තම අදහස් දැක්වීමට සම්මේලනයට සහාභාගි වන්නා වූ නියෝජිතයින්ට අවස්ථාවක් ලබා දිය යුතුය.

## 06. ඡන්දය දීම:

6.1 පක්ෂ සම්මේලනයේ දී හෝ වෙන යම් අවශ්‍ය කෙරෙන විටකදී ඡන්දය දීම පත්‍රිකා මගින් හෝ සමාජිකයන්ගේ වැඩි කැමැත්ත ඇති (පක්ෂයේ නායකයා හෝ ඔහු නොමැතිනම් පක්ෂයේ සභාපති හෝ මහ ලේකම් ගේ හෝ අභිමතය පරිදි) හෝ වෙනත් යම් ප්‍රශස්ථ ක්‍රමයකින් කරනු ලැබිය යුතුය. කෙසේ වුවද ජාතික විධායක සභාවට හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලයට සාමාජිකයන් වැඩිදෙනා හෝ පක්ෂයේ නායකයා විසින් ඉල්ලා සිටි විටෙකදී රහස් ඡන්දයක් පැවැත්වීමද කල හැක.

6.2 එක් නියෝජිතයෙකුට එක් ඡන්දයක් බැගින් හිමි වන අතර සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවකදී මුලාසනයට තම තීරක ඡන්දය පාවිච්චි කළ හැක.

## 07. පක්ෂයේ නිලධාරි මණ්ඩලය:

7.1 එක්සත් ජාතික පෙරමුණ හි නිලධාරී මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

අ) පක්ෂයේ මහා සම්මේලනය විසින් තෝරා පත් කර ගන්නා ලද පක්ෂයේ නිලධාරින් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| පක්ෂ නායක තුමා | 01 |
| සභාපති තුමා | 01 |
| උප සභාපති තුමන්ලා | 05 |
| උප ලේකම් තුමන්ලා | 05 |

ආ) පක්ෂයේ නායකතුමන් විසින් තෝරා පත් කර ගන්නා ලද පක්ෂයේ නිලධාරින් පහත සඳහන් පරිදි වන අතර අවස්ථානුකූලව මහලේකම්වරයෙක් පත් නොකොට මහලේකම ධූරයේ කටයුතු කිරීමට පක්ෂ නායකවරයාට පූර්ණ බලය ඇත. එනමුත් පක්ෂ නායකවරයා කාර්යබහුලයැයි හැඟී ගිය අවස්ථාවලදී මහලේකම්වරයාගේ කාර්යබාරය ඉටු කිරීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩල සාමාජිකයෙකු මහලේකම්වරයා වශයෙන් ඕනෑම අවස්ථාවක පත්කිරීමට පක්ෂ නායකවරයාට බලය ඇත.

| | |
|---|---|
| මහ ලේකම් තුමා | 01 |
| පරිපාලන ලේකම් තුමා | 01 |
| භාණ්ඩාගාරික තුමා | 01 |

7.2 ඉහත සඳහන් වාර්ෂික මහා සම්මේලනයේදි තෝරා පත්කර ගන්නා ලද පක්ෂයේ නිලධාරීන් පුරප්පාඩු වූ අවස්ථාවන් වලදී එම පුරප්පාඩු ඊලඟ වාර්ෂික සම්මේලනය තෙක් පිරවීමට බලය කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඇත. එසේ නමුත් පක්ෂයේ නායකතුමන් විසින් තෝරා පත් කර ගන්නා ලද පක්ෂයේ නිලධාරින් පත්කිරීමේ සහ ඉවත්කිරීමේ පූර්ණ බලය පක්ෂ නායකතුමාගේ අභිමතය පරිදි සිදු වන්නේය.

## 08. මැතිවරණ සහ අනෙකුත් ඡන්ද විමසීම්:

8.1 ජනාධිපති මැතිවරණයකදී යම් අපේක්ෂකයකුගේ නමක් යෝජනා කිරීම, පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් පත් කරනු ලැබූ නාම යෝජනා මණ්ඩලය විසින් කෘත්‍යාධිකාරී මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව කළ යුත්තකි.

8.2 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් පත් කරනු ලැබූ නාම යෝජනා මණ්ඩලය හෝ මණ්ඩල විසින් අදාල දිස්ත්‍රික් සංවිධානයේ සහ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය විමසීමෙන් පසු, යම් පාර්ලිමේන්තු මැතිවරණයක් සඳහා හෝ පළාත් පාලන ඡන්ද විමසීමක් සඳහා හෝ නැතහොත් අපේක්ෂකයාගේ නාම යෝජනා කරනු ලැබිය යුතුය.

8.3 ජනාධිපතිවරයෙකු තේරීමේ මැතිවරණයකට හෝ පාර්ලිමේන්තු මැතිවරණයට හෝ වෙනත් යම් මැතිවරණයකට පක්ෂයෙන් ඉදිරිපත් කරන අපේක්ෂකයන්ගේ නාම යෝජනා පක්ෂයේ ලේකම් විසින්ම අත්සන් කළ යුතුය.

8.4 ජනාධිපතිවරයාගේ ධුර කාලය අවසන් වීමට ප්‍රථම ජනාධිපති ධුරය හිස් වුවහොත් සභාපති වරයාගේ ප්‍රධානත්වයෙන් පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම සහ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය ඒකාබද්ධව පවත්වනු ලබන විශේෂ රැස්වීමක දී ජනාධිපති ධුරය සඳහා සුදුසු අපේක්ෂකයකු රහස් ඡන්දයෙන් තෝරා පත්කරගත යුතුය.

8.5 තමා ජනාධිපති ධුරයට තෝරා ගනු ලැබුවහොත් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් හෝ වෙනත් අධිකාරියක සාමාජිකයෙකු වශයෙන් හෝ පක්ෂයේ අනුග්‍රහයෙන් තෝරා පත් කරගනු ලැබුවහොත් පක්ෂයේ මූලධර්මවලට ප්‍රතිපත්තිවලට වැඩ පිළිවෙලට විනයට සහ පක්ෂයේ චර්යා ධර්මවලට අනුකූලව කටයුතු කරන බවටත්, පක්ෂ නායක වරයා, සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් තමාට දෙනු ලබන පක්ෂයේ තීරණ ක්‍රියාත්මක කරනු ලබන බවටත්, ප්‍රතිඥා දෙන සේ පක්ෂයේ අපේක්ෂකයාගෙන් හෝ අපේක්ෂකවරුන්ගෙන් පක්ෂ නායක වරයා විසින් ඉල්ලා සිටිය යුතුයි. එම ප්‍රතිඥාව දීම හෝ ඔවුන් විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඔහු හෝ ඔවුන් වරදකරුවකු හෝ වරදකරුවන් වන අතර, ඒ සඳහා දඬුවම් දීමට අවශ්‍ය සියලු පියවර කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිර්දේශය මත විධායක මණ්ඩලය විසින් ගනු ලැබිය යුතුයි.

8.6 ඉහත සඳහන් ප්‍රතිඥාව එකී අපේක්ෂකයා හෝ අපේක්ෂකයන් විසින් දෙනු ලැබූ විට,පක්ෂයේ අපේක්ෂකයා හෝ අපේක්ෂකයන් වශයෙන් යථා පරිදි ඔහුගේ හෝ ඔවුන්ගේ නම් ස්ථිර කරනු ලැබිය යුතු අතර, උක්ත මැතිවරණය සඳහා තරඟ කිරීමේදි හැකි සෑම ආධාරයක්ම පක්ෂය විසින් ඔහුට හෝ ඔවුනට ලබාදිය යුතුවේ.

8.7 ඒ අනුව ස්ථිර කරනු ලැබූ සෑම අපේක්ෂකයකුම එක්සත් ජාතික පෙරමුණේ අපේක්ෂකයකු වශයෙන් පමණක් මහජනයා ඉදිරියේ පෙනී සිටිය යුතු අතර,මාධ්‍යවල පෙනී සිටීමේදි මැතිවරණ රැස්වීම් අමතා කථා කිරීමේදී දේශන පැවැත්වීමේදි පක්ෂයේ ප්‍රතිපත්ති වලට සහ නිශ්චිත මැතිවරණය සඳහා අදාළ වන කරුණු වශයෙන් ජාතික විධායක සභාව විසින් මැතිවරණ ප්‍රකාශනයක් මගින් ඉදිරිපත් කරන ලද කරුණු වලට පටහැනි නොවිය යුතුය.

8.8 තෝරා පත්කර ගනු ලැබීමෙන් පසු පක්ෂයේ මූලධර්ම වලට, ප්‍රතිපත්ති වලට වැඩ පිළිවෙලට, රීති වලට, චර්යා ධර්ම පද්ධතියට සහ ස්ථාවර නියෝග වලට අනුකූලව ක්‍රියා කිරීම යම් අපේක්ෂකයකු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඔහු ව්‍යවස්ථාව උල්ලංඝනය කළ තැනැත්තෙකු ලෙස සලකනු ලැබේ.

## 09. පාර්ලිමේන්තු කණ්ඩායම:

9.1 පක්ෂයේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ සාමාජිකයෝ වෙති.

### 9.2 පාර්ලිමේන්තු කණ්ඩායම පිළිබඳ ස්ථාවර නියෝග:

අ) පාර්ලිමේන්තු කණ්ඩායමේ සෑම සාමාජිකයෙකුම විසින් පක්ෂයට පක්ෂපාත බවට ප්‍රතිඥාවක් දිය යුතුය.

ආ) පාර්ලිමේන්තු කණ්ඩායම විසින් පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ සංවිධායකවරයා තෝරා පත් කර ගත යුතුය.

ඇ) පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීම් වලදී පාර්ලිමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් තම අදහස් දැක්විමට අවස්ථාව ලබාදිය යුතු වන අතර, සෑම සාමාජිකයෙකුම තම අදහස් දැක්විමටත් ප්‍රශ්ණ මතු කිරීමටත් ලැබෙන අවස්ථාව හරවත් ලෙස යොදා ගත යුතුය.

ඈ) පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීම් වලදි පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබදව තම අදහස් දැක්විමෙන් පසු ඒ සඳහා පාර්ලිමේන්තු කණ්ඩායම විසින් ගන්නා තීරණය පිළිගෙන එකාවන්ම ඊට අදාල පරිදි සෑම සාමාජිකයකුම කටයුතු කල යුතු අතර පාර්ලිමේන්තුව තුලදී ඒ ගැන කෙරෙන විවාද, ඡන්දය දීම ඇතුළු සෑම ක්‍රියාවක්ම පොදු මතයට හානි නොවන පරිදි ක්‍රියා කළ යුතුය.

ඉ) පක්ෂ ප්‍රතිපත්ති පිළිබදව හෝ මුදල් පිළිබදව හෝ ආණ්ඩුව පිළිබදව හෝ නැතහොත් ජාතික විධායක සභාව විසින් තීරණයක් ගනු ලැබූ හෝ එසේ නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මන්ත්‍රීවරුන්ගේ පුද්ගලික පනත් කෙටුම්පත් හෝ යෝජනා සම්බන්ධයෙන් තමාට අභිමත පරිදි ක්‍රියා කිරීමේ හා ඡන්දය දීමේ සම්පූර්ණ නිදහස පාර්ලිමේන්තු කණ්ඩායමේ සමාජිකයින්ට ඇත්තේය.

ඊ) යම්කිසි විවාදයකට සහාභාගි විමට අපේක්ෂා කරන සාමාජිකයින් විසින් තම අවශ්‍යතාවය පක්ෂ සංවිධායකට දැනුම් දිය යුතු අතර, පක්ෂ සංවිධායක විසින් පාර්ලිමේන්තු කණ්ඩායමේ නායකයා සමග සාකච්ඡා කොට කතා කිරීමේ අනුපිළිවෙල අවස්ථාව ඇති සාමාජිකයාට දන්වනු ලැබිය යුතුය.

උ) පක්ෂ සංවිධානයේ අනුමැතිය නොමැතිව ඡන්ද විමසීම සඳහා ඉල්ලීමක් නොකළ යුතුය.

ඌ) පක්ෂයේ ප්‍රතිපත්ති කෙරෙහි බලපාන ඇතැම් කරුණු වලදී නිදහසේ ක්‍රියා කිරීමට සාමාජිකයන්ට ඉඩ දිය හැකි අතර, තමා ප්‍රකාශ කරන්නේ තමාගේ පෞද්ගලික අදහස් බව එවැනි විවාදයකට සහභාගි වන සාමාජිකයෙකු විසින් පැහැදිලි කළ යුතුය. විවාද වලදී කථා කරන සාමාජිකයන් විසින් තම කථාව පැවැත්වීමේදී පක්ෂයේ අනෙකුත් සාමාජිකයන්ට පහර ගැසීමෙන් වැලකී සිටීමට විශේෂයෙන්ම වග බලා ගත යුතුය.

එ) පක්ෂයේ නායක, සභාපති, මහ ලේකම් තිදෙනාම හෝ පාර්ලිමේන්තු කණ්ඩායමේ නායකයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කවර අවස්ථාවකදී වුවද පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීමක් කැඳවීම ඔවුන් හෝ ඔහු විසින් කළ යුතුය.

ඒ) පාර්ලිමේන්තු කණ්ඩායමේ සාමාජිකයන් අඩකට වැඩි පිරිසක් විසින් අත්සන් කරන ලද ඉල්ලීමක් මගින් ද එවැනි රැස්වීමක් කැඳවීමට ඉල්ලා සිටිය හැක.

ඔ) පක්ෂයේ සෑම මන්ත්‍රීවරයෙකුම ඔහු සඳහා නිකුත් කර ඇති චරියා ධර්ම පද්ධතියට අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටී.

ඕ) පක්ෂය සඳහා ලබා දුන් ඡන්ද හා පක්ෂයේ නියෝජිතයින්ට ලබා දුන් මනාප මගින් තේරී පත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රි වරයකු පක්ෂයෙන් බැහැරව ස්වාධීන ලෙස කටයුතු කිරිම හෝ විපක්ෂයේ වෙනත් පක්ෂයකට සම්බන්ධ වීම හෝ ආණ්ඩුපක්ෂයේ ඇමති, නියෝජ්‍ය ඇමති ධුර බාර ගැනීම හෝ ආණ්ඩු පක්ෂයට සම්බන්ධ වී කටයුතු කිරිම හෝ සිදුවුව හොත් එම මන්ත්‍රි වරයා අප පක්ෂයේ තම මන්ත්‍රි ධුරය ඇතැහැර ගියා සේ සලකනු ලැබේ. පක්ෂයට ලැබුනු ඡන්ද හා පක්ෂයේ නියෝජිතයා වීම හේතුවෙන් ලද මනාප ඡන්ද හේතුවෙන් එම මන්ත්‍රි ධුරය පක්ෂයට හිමි නිසා මන්ත්‍රි ධුරයට තරඟ කල වෙනත් සුදුසු අපේක්ෂයකුගෙන් එම පුරප්පාඩුව පිරිවීම සිදුකරනු ලැබේ.

## 10. පළාත් සභා සහ පළාත් පාලන ආයතන නියෝජිත කණ්ඩායම්:

පාර්ලිමේන්තු කණ්ඩායම පිළිබඳව ඉහත දක්වන ලද 9 වන වගන්තිය යටතේ 9.1 සහ 9.2 (අ) සිට (ඕ) දක්වා වගන්ති වල සඳහන් ස්ථාවර නියෝග අවශ්‍ය වෙනස් කිරීම් සහිතව පළාත් සභා මන්ත්‍රීවරුන්ට සහා පළාත් පාලන මන්ත්‍රීවරුන්ට එකසේ බලපානු ඇත.

## 11. නිලවරණ:

මෙම ව්‍යවස්ථාවේ සඳහන් සියලු සංවිධාන වල නිලවරණ වාර්ෂිකව හෝ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලය තුල පැවැත්විය යුතුය.

## 12. නිලධාරි මණ්ඩලයේ හා සාමාජික ලේඛණ පවත්වාගෙන යෑම:

12.1 පක්ෂයේ මහ ලේකම් හා පරිපාලන ලේකම් විසින් නිලධාරි මණ්ඩල සාමාජිකයින්ගේ හා සංවිධාන වලට අයත් ලේඛණ පවත්වා ගෙන යා යුතු අතර ඒවා වාර්ෂිකව යාවත්කාලීන කල යුතුය.

## 13. පක්ෂ අරමුදල්:

13.1 පක්ෂ නායකගේ මූලිකත්වයෙන් කෘත්‍යාධිකාරි මණ්ඩල සහ විධායක සභාවේ සාමාජිකයින් ගෙන් සමන්විත මුදල් කාරක සභාවක් කෘත්‍යාධිකාරි මණ්ඩලය විසින් පත් කළ යුතුය.

13.2 පක්ෂයේ වියදම් සඳහා අරමුදලක් ඇති කිරීමට කාරකසභාව විසින් අවශ්‍ය විධිවිධාන සැලසිය යුතුය.

13.3 භාණ්ඩාගාරික විසින් පක්ෂයට ලැබෙන සියළුම මුදල් වලට කුවිතාන්සි යැවීම හා ගනන් තැබීම නොවරදවා කළ යුත්තකි.

13.4 ලැබෙන්නා වූ මුදල් පක්ෂයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ උපදෙස් මත ගිණුමක් අරඹා තැන්පත් කළ යුතුය. බැංකුවල තැන්පත් කරන ලද මුදල් ගනුදෙනු කළ යුත්තේ පක්ෂ නායක, සභාපති, මහ ලේකම් සහ භාණ්ඩාගාරික යන අය ගෙන් දෙදෙනෙකුගේ ගේ අත්සන් ඇතිවය.

13.5 පක්ෂ නායකතුමාගේ හෝ සභාපතිතුමාගේ අනුමැතිය ඇතිව අවශ්‍ය හදිසි වියදමක් කිරීමට භාණ්ඩාගාරිකට බලය ඇති අතර ඒ සඳහා වාර්තාවක් කෘත්‍යාධිකාරි මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

13.6 ගෙවුනු වර්ෂයේ අයවැය පිළිබඳව ගණන් පරීක්ෂකයින් විසින් සකස් කරන ලද මුදල් කාරක සභාව විසින් අනුමත කරන ලද වාර්තාවක් සෑම වර්ෂයකම ජාතික විධායක සභාවට ඉදිරිපත් කළ යුතුය.

## 14. පක්ෂයේ චංචල නිශ්චල දේපල:

14.1. කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සම්මත කරගත් තීරණයකින් පසු පක්ෂය විසින් චංචල හා නිශ්චල දේපල අත්පත් කර ගැනීම සඳහා පක්ෂයේ අරමුදල් ප්‍රයෝජනයට ගැනීම නීත්‍යානුකුල වන්නේය.

14.2 තවද, මෙම ව්‍යවස්ථාව සම්මත වූ දින සිට පක්ෂය සතු වූ හෝ අනාගතයේදී පක්ෂය සතුවන කවරම හෝ නිශ්චල හා චංචල දේපල විකිනීම, උකස් තැබීම, කුලියට දීම සහ වෙනත් එබඳු ඕනෑම ගනුදෙනුවක් සඳහාද කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තීරණය අවශ්‍ය වන්නේය.

14.3 දේපල භාරකාර මණ්ඩලයේ අනුමැතිය ඇතිව පක්ෂයේ පහත සඳහන් නිලධාරීන් අතුරෙන් තිදෙනෙකුගේ නමින් ලියා අවසන් කළ විට එය පක්ෂයේ දේපල බවට පත් වන්නේය. (පක්ෂයේ නායක, සභාපති, මහ ලේකම්, පරිපාලන ලේකම්, භාණ්ඩාගාරික)

14.4 පක්ෂය සතු නිශ්චල සහ චංචල දේපල නඩත්තු කිරීම හා පරිපාලනය කිරීම සඳහා 14.3 වගන්තිය යටතේ දැක්වෙන නිලධාරීන් අතුරෙන් තුන් දෙනෙක් ගෙන් යුතු දේපල භාරකාර මණ්ඩලයක් ජාතික විධායක සභාව විසින් පත්කළ යුතුය. පක්ෂයේ නායක තුමාට මෙම භාරකාර මණ්ඩලයට තවත් සාමාජිකයෙක් වශයෙන් විධායක සභිකයකු පත් කළ හැකිය.

14.5 පක්ෂය සතු කවරම දේපලක් පිළිබඳව හෝ ඔප්පුවක් හෝ වෙනත් ලියවිලි ඇතිකර ගැනීමට අවශ්‍යතාවයක් ඇති වූ විටෙක එම ඔප්පු හා ලියකියවිලි ද එකී භාරකාර මණ්ඩලයේ තිදෙනෙකු විසින් අත්සන් කළ යුතුය.

14.6 කිසියම් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් වෙත දේපල පැවරීම සඳහා අවශ්‍ය වන කිසියම් හිමිකරයක් පැවරීමේ නියෝගයක් හෝ වෙනත් සහතික කිරීමක් නොමැතිව එවැනි දේපලවල හිමිකමක් අදාළ අවස්ථාවේදී එවැනි තනතුරක් උසුලන හෝ එවැනි තනතුරකට කටයුතු කරන හෝ එවැනි රාජකාරියක් ඉටුකරන පුද්ගලයා හෝ පුදගලයන්ට උරුම වනු ඇත.

14.7 විකිණීම්, උකස්තැබීම්, හෝ බදු දීම වශයෙන් හෝ වෙනත් අන්දමකින් හෝ එවැනි දේපල සම්බන්ධයෙන් කටයුතු කිරීමට එම කාර්යය සඳහා එම දේපල සම්බන්ධයෙන් එවැනි ඕනෑම ආකාරයකින් කටයුතු කිරීමට එම නිලධාරීන්ට බලය පවරමින් පක්ෂයේ කෘත්‍යාධිකාරි මණ්ඩලය විසින් ගනු ලබන තීරණයකින් පසු එම නිලධාරීන් විසින් කටයුතු කිරීම නීත්‍යානුකූල වන අතර, එසේ කිරීම එම නිළධාරීන්ට පැවරෙයි.

## 15. පොදු විධි විධාන:

15.1 කිසියම් වර්ෂයක නව නිලධාරීන් පත් කරන තෙක් පැරණි නිළධාරීන් ක්‍රියාත්මක විය යුතුය.

15.2 මෙම ව්‍යවස්ථාවේ නිර්දිෂ්ඨ කවරම සංවිධායක හෝ අනු සංවිධානයක (මහා සම්මේලනයක් හැර) සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක (1/3) අත්සනින්, මාසයක් කල් දී කරන ලිඛිත ඉල්ලීමක් උඩ සංවිධානයේ ලේකම් හා සභාපති විශේෂ රැස්වීමක් කැඳවීමට වග බලා ගත යුතුය. එම ලිඛිත ඉල්ලීමේ රැස්වීම කැඳවීමේ හේතු දැන්විය යුතු අතර, රැස්වීම් කැඳවීම පිළිබඳ දැන්වීමේ එම හේතු ලේඛනගත විය යුතුය.

15.3 මෙම ව්‍යවස්ථාවේ නිර්දිෂ්ඨ සංවිධාන වල රැස්වීම් සඳහා සණපූරණය සාමාජිකත්වයෙන් තුනෙන් එකක් (1/3) සේ සැලකිය යුතුය.

15.4 මෙම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කවර හෝ සංවිධානයක නිලධාරියෙකු හෝ එම සංවිධානයෙන් වෙනත් සංවිධානයකට තෝරා පත්කර ගත් නියෝජිතයෙකු හෝ ඉල්ලා අස්වීමෙන් හෝ මොනම හේතුවකින් හෝ කිසියම් නිලයක් හෝ නියොජිකත්වයක් පුරප්පාඩු වුවහොත්, ඊළඟ නිලවරණයේදී එම පුරප්පාඩුවට කෙනෙකු තෝරා පත් කර ගන්නා තෙක් එකී පුරප්පාඩුව කෘත්‍යාධිකාරි මණ්ඩලය විසින් හෝ එහි උපදෙස් පරිදි හෝ පිරවීමට අදාළ සංවිධාන ක්‍රියා කළ යුතුය.

15.5 මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් කරනු සම්බන්ධයෙන් අවශ්‍ය වන අතුරු ව්‍යවස්ථා රෙගුලාසි සකස් කර ඒවා ක්‍රියාත්මක කරවීමට පක්ෂයේ ජාතික විධායක සභාව කටයුතු කළ යුතුය.

15.5 පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අවසරය ඇතිව පක්ෂයට සම්බන්ධ වෙනත් සංවිධන ගොඩනැගිය හැකි අතර, ඒවා මෙම ව්‍යවස්ථාවට යටතේ වේ.

## 16. සාමාන්‍ය විධි විධාන:

16.1 මෙම ව්‍යවස්ථාවට හෝ ස්ථාවර නියෝග වලට ඇතුළත් නොවූ ක්‍රියා මාර්ග පිළිබඳව යම් කාරණයක් පැන නැගුන හොත් හෝ ව්‍යවස්ථාවෙහි සඳහන් යම් විධානයක් තේරුම් ගැනීම පිළිබඳව යම් සැකයක් ඇති වුවහොත් ඒ කාරණය කෘත්‍යාධිකාරි මන්ඩලය විසින් අවධානයට ගෙන නිරවුල් කළ යුතුය.

16.2 මේ ව්‍යවස්ථාවට අනුව සැකසුණු ඉංග්‍රීසි හෝ දෙමළ පරිවර්තනයේ යම් වෙනසක් ඇතිවුවහොත් පක්ෂයේ කටයුතු සඳහා පිළිගනු ලබන්නේ මේ ව්‍යවස්ථාව මිස එහි ඉංග්‍රීසි හෝ දෙමළ පරිවර්තනය නොවේ.

16.3 මෙම ව්‍යවස්ථාවේ නිර්දේශිත කවර හෝ සංවිධානයකට සාමාජිකයින් තොරා පත් කර ගැනීමේදී ඒ ඒ මැතිවරණ දිස්ත්‍රික්කවල ඡන්ද දායකන්ගේ ප්‍රතිශතය සැලකිල්ලට ගත යුතුය.

(ප්‍රථම ව්‍යවස්ථා කෙටුම්පතට පසුව 2011-06-15 සහ 2013-03-16 දිනයන්හි සම්මත කර ගන්නා ලද සියළුම සංශෝධන සහිත ව්‍යවස්ථාව වේ.)

පක්ෂ නායක

සභාපති

මහ ලේකම්

දිනය: 2013-03-16